// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2260/65 - 2021 දෙසැම්බර් මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2021.12.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරිය වන මහා නගර සභා ආඥාපනතේ 326 වන වගන්තිය යටතේ කරනු ලබන නියමයයි

ඌව පළාතේ ආණ්ඩුකාර ඒ. ජේ. එම්. මුසම්මිල් වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරිය වන මහා නගර සභා ආඥාපනතේ 326 වන වගන්තිය යටතේ සඳහන් විධිවිධාන මඟින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් නියමයන් මෙයින් දන්වා සිටිමි.

ඒ. ජේ. එම්. මුසම්මිල්,
ආණ්ඩුකාරවර,
ඌව පළාත.

2021 දෙසැම්බර් මස 30 වැනි දින
ආණ්ඩුකාරවර කාර්යාලය,
රජවීදිය,
බදුල්ල.

**නියමය**

ඌව පළාතට අයත් බදුල්ල මහා නගර සභාවේ නගරාධිපතිවරයා විසින් 2022 වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය මහා නගර සභා ආඥාපනතේ 211 වගන්ති ප්‍රකාරව සකස්කොට මහ නගර සභා ආඥාපනතේ 213 වගන්ති ප්‍රකාරව අයවැය අවසාන වශයෙන් සලකා බැලීම සඳහා සභාවට ඉදිරිපත් කරනු ලැබ, එය සම්මත කරනු නොලැබීම හා 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් 2021.12.31 දින මධ්‍යම රාත්‍රියේ සිට නගරාධිපති ධුරය අතහැර ගියා සේ සලකා ,එදින සිට බලපැවැත්වෙන පරිදි අදාළ බදුල්ල මහා නගර සභාවේ නගරාධිපති ධුරය පුරප්පාඩු වූවා සේ සැලකිය යුතුය.

EOG 12 - 0344/1

1A - PG 5677 — 15 (2021/12)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඌව පළාත**

(252 වන අධිකාරය වූ) මහා නගර සභා ආඥාපනත

(252 වන අධිකාරිය වන) මහා නගර සභා ආඥාපනත යටතේ මා වෙත ලැබී ඇති බලතල අනුව, ඌව පළාත් ආණ්ඩුකාර වන ඒ. ජේ. එම්. මුසම්මිල් වන මම පහත සඳහන් නියමයන් දැනුම් දෙමි.

**ඒ. ජේ. එම්. මුසම්මිල්,**
ආණ්ඩුකාරවර,
ඌව පළාත.

2021 දෙසැම්බර් මස 30 වැනි දින,
ආණ්ඩුකාරවර කාර්යාලය,
රජවීදිය,
බදුල්ල.

**නියමය**

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයට අයත් සීමාව තුළ පිහිටි බදුල්ල මහා නගර සභාවේ 2022 වර්ෂයට අදාළ අයවැය වාර්තාව මහා නගර සභා ආඥාපනතේ 215, 215 අ වගන්තිවල අවශ්‍යතා අනුව සම්මත කිරීමට අපොහොසත් වීම හේතුවෙන් බදුල්ල මහා නගර සභාවේ නගරාධිපතිවරයාගේ තනතුර 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තිය අනුව පුරප්පාඩු වන බැවින් 2012 අංක 22 වන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන ) පනතට අනුව එම පුරප්පාඩුව පිරවෙන තෙක් නගරාධිපතිවරයාගේ තනතුර පුරප්පාඩු වූ දින සිට එම තනතුරේ බලතල, කටයුතු, කාර්ය, ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම සඳහා මහා නගර සභා ආඥාපනතේ 14(6) වගන්ති ප්‍රකාරව නියෝජ්‍ය නගරාධිපතිවරයා වෙත පැවරෙන බව මෙයින් දැනුම් දෙමි.

තව ද, පත්ව එනු ලබන අලුත් නගරාධිපතිවරයා විසින් 2022 වර්ෂයට අදාළ අයවැය සභාව වෙත ඉදිරිපත්කොට සම්මත කරන තෙක් බදුල්ල මහා නගර සභාවේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම තහවුරු කිරීම පිණිස බදුල්ල මහා නගර සභාවේ නාගරික කොමසාරිස්ගේ නිර්දේශය මත සහ පළාත් පාලන කොමසාරිස්ගේ පූර්ව අනුමැතිය මත බදුල්ල මහා නගර සභාවේ 2022 වර්ෂයට අදාළ පුනරාවර්තන වියදම් හා එල්.ඩී.එස්.පී. ව්‍යාපෘතිය ඇතුළු මේ වන විට ක්‍රියාත්මකව පවතින විශේෂ ව්‍යාපෘතිවලට අදාළ අත්‍යවශ්‍ය වියදම් දැරීම සඳහා මා විසින් බදුල්ල මහා නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපතිවරයාට මෙයින් නියම කරමි.

EOG 12 - 0344/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.